**පොළොන්නරුව මහා නගර සභාව - 2021**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

පොළොන්නරුව මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

  - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

  - භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

  - මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජුලි 03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ නිකුත් කර ඇති උතුරු මැද පළාත් මහා නගර සභාවල මූල්‍ය පරිපාලන රීති අංක 96 හා 97 අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා වත්කම් වගකීම් ප්‍රකාශයේ අයවැයගත තොරතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙර වර්ෂයට අදාළ සැසඳිය හැකි තොරතුරුද ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි නිවැරදි කිරීමට කටයුතු කරමි. | රීති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | | | |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ විවිධ ණයහිමි වටිනාකම රු.2,005,495 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය (CDLG) මගින් පෙරටු කාර්යාලය සංවර්ධනය කිරීම සඳහා ලැබිය යුතු රු.500,000 ක මුදල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කර නොතිබුණු අතර, එම වටිනාකමට මිලදී ගත් වත්කම්, ස්ථාවර වත්කම් යටතේද ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පරිශිෂ්ඨය 02 හි E.G. 10.1 ප්‍රකාරව ව්‍යාපෘති නිම කර ඇති ප්‍රමාණය | පිළිගනිමි. | ණයහිමි වටිනාකම ලෙස නිම කළ |

| | | | |
|---|---|---|---|
| | අනුව වටිනාකම හඳුනාගත යුතු වුවත් ව්‍යාපෘති 49 ක ඇස්තමේන්තු මුදල වූ රු.188,481,762 ක් ණයහිමි ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවද, ගිවිසුම්ගත වටිනාකම හා නිම කළ ප්‍රතිශතය අනුව හඳුනාගත යුතු වටිනාකම රු.109,378,043 ක් වීමෙන් ණයහිමි වටිනාකම රු.79,103,719 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | ප්‍රතිශතය අනුව වටිනාකම හඳුනාගත යුතුවේ. |
| (ඇ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පරිශිෂ්ඨය 02 හි E.G. 10.1 ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ සහතික කළ වටිනාකම කොන්ත්‍රාත්තුව මත අයභාරය ලෙස හඳුනාගත යුතු වුවද, මහා නගර සභාව ණයගැතියෝ ලෙස රු.190,895,844 ක මුදලක් හඳුනාගෙන තිබුණි. සහතික කළ වැඩ වටිනාකම අනුව හඳුනාගත යුතු අගය රු.152,897,991 ක් වීමෙන් කර්මාන්ත ණයගැති ශේෂය රු.37,997,853 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | ණයගැති වටිනාකම ලෙස සහතික කළ වටිනාකම හඳුනාගත යුතුවේ. |
| (ඉ) | රු. 7,781,329 ක් වටිනා කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | පිළිගනිමි. | ප්‍රමිතයේ පරිශිෂ්ඨය ප්‍රකාරව ගැලපීම් කළ යුතුවේ. |
| (ඊ) | වටිනාකම රු.9,660,000 ක් වූ ඉඩම් කට්ටි 03 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් යටතේ දක්වා නොතිබීමෙන්, වර්ෂයේ දේපල,පිරියත උපකරණවල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වටිනාකම අනුව සංශෝධන කළ යුතුවේ. |
| (උ) | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ අතිරික්තයේ හෝ (ඌණතාවයේ) ඇතුළත් කර නොමැති ප්‍රාග්ධන වියදම් ප්‍රදාන යටතේ 2021 ජනවාරි 01 දිනට තිබිය යුතු රු.1,908,000 ක ශේෂය ඇතුළත් නොවීම සහ 2021 වර්ෂයට අදාලව රු.20,236,105 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් එකතුව රු.22,148,005 ක් එම ප්රකාශනයේ අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක උසාවි දඩ ශේෂය අඩුවෙන් දැක්වීම නිසා දෙසැම්බර් 31 දිනට උසාවි දඩ ආදායම් රු.5,405,714 ක අතිරික්තයක් ලෙස දක්වා තිබුණද, නිවැරදි උසාවි දඩ ශේෂය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2021.12.31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම සම්බන්ධයෙන් පළාත් භාණ්ඩාගාරයෙන් කළ විමසීමේදී එය රු. 3,236,533 ක් බව ප්‍රකාශ කළ නමුත් එම වටිනාකම තහවුරු කර ලිපියක් පළාත් භාණ්ඩාගාරය වෙතින් ලැබී නොමැත . | නිවැරදි ශේෂය හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්ම වූ වියදම රු.12,003,474 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයභාරය රු.13,714,918 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂ අවසානයට හිඟ කඩ කුලී ආදායම රු.19,305,671 ක් පැවති අතර, එයින් කඩ කාමර 88 කට අදාලව රු.9,796,872 ක වටිනාකමක් වර්ෂ 02 ත් 04 ත් අතර කාලයක සිට ගිවිසුම් ප්‍රකාරව අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩකුලී අයකිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | කඩකුලී ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | පොළොන්නරුව නව පොදු වෙළඳ සංකීර්ණයේ (PCC) කඩ කාමර බදුදීමේ ගිවිසුම් පත්‍රයට අනුව ආපසු නොගෙවන තැන්පත් මුදල බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරුට එකවර හෝ සියයට 50 ක් ගෙවා ඉතිරි මුදල 2020 දෙසැම්බර් මස 02 දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් එසේ නොවන විට ගිවිසුම අවලංගු වන බවත් දක්වා තිබුණද, රු.16,338,750 ක් වටිනා තැන්පත් මුදල සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද හිඟව පැවතුණු නමුත්, ඊට අදාළ ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | ආර්ථිකමය බිඳවැටීම් හා කඩකාමර වල පවතින ඉදිකිරීම් දුර්වලතා නිසා ව්‍යාපාරිකයින් විසින් කඩ කාමර විවෘත කිරීම සිදු නොකරන ලදි. කඩ හිමියන් සහ සභාව අතර පැවති සාකච්ඡාවලදී කඩ හිමියන් කඩ විවෘත කිරීමට එකඟතාවයකට නොපැමිණීම හේතුවෙන් මෙම වෙළඳ සංකීර්ණයෙහි වැඩකටයුතු අසාර්ථක වීම සිදුවිය. එම හේතුවෙන් කී මනී මුදල ගෙවීමද තාවකාලිකව නතර වී තිබේ. ඉදිරියේදී මොරටු විශ්ව විද්‍යාලය හරහා මෙම ගොඩනැගිල්ලෙහි තාක්ෂණ විගණනයක් සිදුකර ඉදිකිරීම් සමාගම සමග සාකච්ඡා කර අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2020 වර්ෂයේ ලබාදී තිබූ කදුරුවෙල බස් නැවතුම් පොළ කඩ කාමර හා රෝහල හන්දියේ පිහිටි පිබිදෙමු පොළොන්නරුව කඩ කාමර ආරම්භක තැන්පත් (Key money) මුදලින් රු.1,307,295 ක මුදලක් 2022 ඔක්තෝබර් 03 වන දින වන විටත් | මෙම හිඟ කීමනී මුදල මේ වන විට හිඟ කඩකුලී සමඟ කොටස් වශයෙන් කඩහිමියන් විසින් ගෙවමින් පවතින බව සඳහන් කරමි. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

අයකර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මහා නගර සභාව විසින් රු. 34,190,583 ක වියදමක් දරා දිරන කසල ටොන් 3285 ක් හා නොදිරන කසල ටොන් 1095 ක් එකතු කර තිබූ අතර, දිරන කසල වලින් ඉතා සීමිත ප්‍රමාණයක් යොදා කාබනික පොහොර ටොන් 58 ක් පමණ වර්ෂය තුළ නිපදවා ඇති අතර, නොදිරන කසල වලින් ඉතා සීමිත ප්‍රමාණයක් බේල් කර තිබුණි. ඒ අනුව ඉතිරි වූ සියලුම දිරන හා නොදිරන කසල මහා නගර සභාව සතු ගල්ලැල්ල කසල අපහරණ භූමිය තුල විවෘතව බැහැර කිරීම හේතුවෙන් දැඩි පරිසර හානියක් සිදුවෙමින් පවතින නමුත් විධිමත් කසල බැහැර කිරීමේ සැලැස්මක් සකස් කර නොතිබුණි. නොදිරන කසල බේල් කිරීම හා දිරන කසල සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වාගැනීමක්ද සිදුකර නොතිබුණි. කසල අපහරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ව්‍යාපෘති වාර්තාවක් සකස් කර තිබුණද, සමාලෝචිත වර්ෂය වන විට එය තාවකාලිකව නතර කර තිබුණි. | විධිමත් නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ පිළිවෙල කෙරෙහි මහා නගර සභාවේ විශේෂ අවධානය යොමු කර ඇති අතර නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් මෙම වැඩ සටහන සම්බන්ධ ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඇත. එම වාර්තාවට අනුව ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කර තිබුණ ද මේ වන විට රට තුල පවතින තත්වය මත එම ව්‍යාපෘතිය තාවකාලිකව නතර වී ඇත. එම හේතුව නිසා නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමට අද වන විට නොහැකි වී ඇත. | නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහනක් නොපමාව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවේ. |